**සීතාවකපුර නගර සභාව**

**කොළඹ දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 26 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූලි 09 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 අගෝස්තු 31 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කරඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

අ. ගිණුම්කරණ අඩුපාඩු

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (i) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය මුදල වූ රු.58,213,296 ක් ගිණුම්ගත කර නොතිබුණි. | කාල පරිච්ඡේදයට ඇතුලත් සියළු ගනුදෙනු ගිණුම්ගත කළ යුතුවේ. | දේශිය ණය සංවර්ධන අරමුදල - ගෙවිය යුතු ණය හා පොලී මුදල රු.63,216,846 කි.<br>මෙම මුදලට අදාළ පැහැදිලි කිරීම් පහත පරිදි වේ.<br>රු.<br>බස් නැවතුම්පල හිඟ පොලිය 58,213,296<br>2018 දෙසැම්බර් පොළිය 642,550<br>වැසි ජල කාණු පද්ධතිය හිඟ පොළිය 4,272,493<br>2018/12/31 දිනට හිඟ පොළිය 88,507 |
| (ii) දේශීය ණය සංවර්ධන අරමුදලෙන් වැසි ජල කාණු සඳහා ලබාගත් ණය මුදල වූ රු.4,272,494ක මුදල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි. | නිවැරදි වර්ගීකරණයන් යටතේ දැක්විය යුතුවේ. | පිලිතුරු ඉදිරිපත්කර නැත. |

ආ. නොසැසඳුනු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන දේශීය ණය සංවර්ධන අරමුදල් ගිණුමෙහි ශේෂය හා උපයෝගී පොත්/උපලේඛණවල දැක්වෙන ශේෂයන් අතර රු.62,485,567ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | මෙම මුදල පහත පරිදි ණය පොළිය එකතු වී සකස් වී ඇති අතර එය අපගේ ලේඛන වලට අනුව රු.62,485,789.94 ක් විය යුතුය .<br>රු.<br>බස් නැවතුම්පල ඉදි කිරීම - 58,213,296.64<br>වැසි ජල කාණු පද්ධතිය - 4,272,493.30<br>62,485,789.94 |

ඇ. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය<br>විෂයය | <br>වටිනාකම<br>රු. | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|---|
| (අ)අත්තිකාරම් | 801,258 | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම ශේෂය 2007 වර්ෂයට පෙර වර්ෂ වල සිට ගිණුම් වල පවතින ශේෂයකි. 1989 වර්ෂයේ රු.200,000 පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අතර එම මුදල අත්තිකාරම් ගිණුම නොපියවා අදායමට ගෙන ඇති බව පෙනේ. එය විගණනයේ නිරීක්ෂණයට අනුව නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ)පෞද්ගලික බස් නැවතුම් පල ගාස්තු | 230,700 | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වාර්ෂිකව බිල් නොකල යුතු මුදලක් 1998 වර්ෂයේ දී රු.230,700ක් ලෙස බිල් කර ඇත. මෙම මුදල අයකර ගත නොහැකි ශේෂයන් ලෙස හඳුනාගෙන කපා හැරීම සඳහා ප්‍රධාන අමාත්‍ය ලේකම් වෙත යොමු කර ඇත. |
| (ඇ) තානායම් කුලිය | 195,089 | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙය පැරණි හිඟ මුදලක් වන අතර ලේඛනවලින් සොයා ගැනිමට නොහැකි වී ඇති බැවින් ඉදිරියේ දී මෙම ශේෂය නිරවුල් කර ගැනිමට කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ඈ)වෙළඳපල කඩ කුලිය | 1,211,621 | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ මුදල වන රු.1,211,621 ක මුදල අය කර ගැනිමට කටයුතු කරන බව දන්වමි. |

ඈ. විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සභාව සතු ඉඩම් ගොඩනැගිලි 26 ක් සභාව වෙනුවෙන් අයිතිය තහවුරු කරන ඔප්පු ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී | සභාවේ දේපල වලට අදාල නෛතික | සභාව සතු දේපල සම්බන්ධව ක්‍රියාකිරීම සඳහා “සභා දේපල හඳුනා ගැනිමේ හා නීත්‍යානුකුල කිරිමේ කමිටුව” පත් කර ඇති අතර එම කමිටුව මගින් ලබා |

| | | |
|---|---|---|
| ඒවා සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය. | අයිතිය හදුනාගැනීමට කටයුතු කල යුතුවේ. | දෙන වාර්තා අනුව ඔප්පු නොමැති දේපල සඳහා නීත්‍යානුකූලව ඔප්පු සකස්කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |

1.4 අනුකූල නොවීම.

---------------------

නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

| නීති,රීති රෙගුලාසි හාකළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි මු.රෙ. 371 (5) | වසර 07ක සිට පැවත එන රු.801,258 ක අත්තිකාරම් ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි සංග්‍රහය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | 1989 වර්ෂයේ චවුචර් අංක 6 හා 1989/01/06 දිනැති චවුචරයෙන් රු.200,000 පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ලැබී ඇති අතර එම මුදල අත්තිකාරම් ගිණුම නොපියවා 3:8:81 යටතේ අදායමට ගෙන ඇත. එය නිවැරදි කිරිමට කටයුතු කරමි. ඒ අනුව නොපිය වූ අත්තිකාරම් මුදල රු.801,258කි. |
| (ආ) බස්නාහිර පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ 2016 ජුලි 11 දිනැති අංක LGD/08/2016 දරන චක්‍රලේඛය | පළාත් පාලන ආයතනයන්ට අයිති ඉඩම් හා දේපළ භෞතිකව හඳුනා ගැනීම, මිනින්දෝරුවකු මගින් මිනුම් කිරීම සම්බන්ධයෙන් 2017 ඔක්තෝබර් 4 දින නිලධාරීන් 05 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කර තිබුණද 2018 දෙසැම්බර් 31 දිනතෙක් එම ක්‍රියාවලිය ආරම්භකර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කර සභාවට අයිති දේපල භෞතිකව හඳුනාගත යුතුවේ. | 2019/03/15 දින සභාව සතු දේපළ සම්බන්ධව තොරතුරු ලබා දෙන ලෙස නාගරික මන්ත්‍රීවරුන් වෙත දන්වන ලදී. |
| (ඇ) 1993 නොවැම්බර් 18 දිනැතිඅංක 15 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය අවසානයට නාගරික සංවර්ධන අධිකාරිය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන තැන්පත් ගිණුමේ ඇති රු.3,061,037ක මුදල් කිසිදු සංවර්ධන කටයුත්තක් සඳහා ආයෝජනය කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතුවේ. | නාගරික සංවර්ධන අධිකාරිය නමින් පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුමේ ඇති මුදල් කොම්පෝස්ට් අංගනයේ ලීචාර්ට් ටැංකි ඉදිකිරිම සඳහා ආයෝජනය කිරිමට අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම ක්‍රියාත්මක වෙමින් පවති. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.17,280,897 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.17,263,911 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම් රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 21,469,000 | 21,492,302 | 15,144,489 | 6,347,813 | 21,095,000 | 21,063,558 | 20,671,264 | 6,441,094 |
| (ii) කුලී | 36,892,300 | 35,739,572 | 31,179,463 | 4,560,109 | 29,328,800 | 30,764,376 | 31,165,161 | 17,229,580 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,351,500 | 943,819 | 905,419 | 38,400 | 1,443,500 | 845,394 | 845,394 | 89,710 |
| (iv) වෙනත් ආදායම් | 30,801,500 | 35,862,324 | 18,146,402 | 17,715,922 | 30,907,200 | 20,701,300 | 30,418,236 | 1,864,955 |
| එකතුව | 90,514,300 | 94,038,017 | 65,375,773 | 28,662,244 | 82,774,500 | 73,374,628 | 83,100,055 | 25,625,339 |

#### 2.2.2 වරිපනම් හා බදු

වරිපනම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| | | රු. |
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.6,283,342 ක් වූ අතර මෙම ශේෂය තුල වසර 05කට වඩා වැඩි හිඟ ශේෂය රු.555,932 ක් ද වසර 03කට වඩා | සභාවට අයවිය යුතු වරිපනම් බදු | වසර 3ත් 5ත් අතර හිඟය ජංගම සේවා හා දේපළ තහනමට ගැනිමෙන් අය කර ගැනිමට කටයුතු සලසා ඇත. |

| | |
|---|---|
| පැරණි හිඟ ශේෂ රු.1,849,359 ක් ද පැවතුණු අතර මෙම හිඟයන් මෙතෙක් අයකර ගෙන නොතිබුණි. | අප්‍රමාදව අයකර ගත යුතුවේ. |

2.2.3 කුලී

------

(ආ) වෙළඳ ස්ථාන කුලී

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වෙළඳ ස්ථාන කුලී රු.3,245,470 ක්වූ අතර එම හිඟයන් මෙතෙක් අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු කුලී ආදායම අප්‍රමාදව අයකර ගත යුතුවේ. | මෙම හිඟ මුදලින් මේ වන විට රු.2,033,850 ක මුදල අය කර ගැනිම සඳහා කටයුතු කරමින් පවතී. |

(ආ) බදුකර කුලී

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| වර්ෂ 10කට වැඩි බදුකර කුලී හිඟය රු.85,320 ක්වූ අතර එම හිඟ ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | මෙම හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

3.1 කාර්යසාධනය

------------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා,සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබූ කාර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

-------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 153 වගන්තිය ප්‍රකාරව සභාව විසින් අතිරේඛ ආදායම් උපයා ගැනීමට අතුරු ව්‍යවස්ථාවක් සම්පාදනය කර අනුමැතිය ලබානොගෙන 2018 වර්ෂයේදී ආදායම් මාර්ග 06ක් වෙනුවෙන් රු.8,570,676 ක ආදායමක් උපයාගෙන තිබුණි. | නගර සභා ආඥා පනතේ 153 වගන්තිය කෙරෙහි අවධානය යොමු කල යුතුවේ. | සම්මත අතුරු ව්‍යවස්ථාව යටතේ අතුරු ව්‍යවස්ථා 14 ක් වැළඳ ගැනීම සිදු කර ඇති අතර සභාව තුල මේ වන විට අතුරු ව්‍යවස්ථා කමිටුවක් පත් කර අවශ්‍ය අතුරු ව්‍යවස්ථා හඳුනාගෙන කෙටුම්පත් සකස් කිරිම මේ වන විට සිදු කරමින් පවතී. නගර ශාලාව සඳහා මේ වන විට අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් සකස් කිරිම සිදු කරමින් පවතී. ඉදිරියේ දී අතුරු ව්‍යවස්ථා සම්පාදනය කර ආදායම් මාර්ග කෙරෙහි අවධානය යොමු කරමි. |

(ආ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| 2018 මාර්තු 21 දිනැති අංක 18/0309/744/009 දරණ අභියාචනා මණ්ඩල තීරණය පරිදි කසළ අංගණයක් ස්ථාපිත කිරීම සඳහා පුස්සැල්ලාව වැවිලි සමාගමට අයත් වතුයායෙන් අක්කර 05 ක බිම් කොටසක් අත්පත් කරගැනීමට අවශ්‍ය කටයුතු කර කසළ කන්දේ ඇති අවදානම ඉවත් කිරීමට සභාව විසින් මේ වනතෙක්ම කටයුතු කර නොතිබුණි. | නොපමාව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | නව කසල රඳවනය සඳහා පුස්සැල්ලාව සමාගම විසින් ලබා දීමට යෝජිත ඉඩමෙහි මැනුම් කටයුතු අවසන් කර එහි සැලැස්ම සකස් කර අවසන්ව එහි තක්සේරුව ලබා ගැනීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත පරිසර නිර්දේශය ලබා ගැනීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත යොමු කර ඇත. |

(ඇ) පාරිසරික ගැටළු

---------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (ii) වැවේ කැලේ පාරිසරික සංචාරක ස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය<br>--------------------------------------------------<br>ප්‍රදේශවාසී ප්‍රජාවට තිරසර සංවර්ධන ප්‍රවේශයක් ලබාදීම සඳහා අක්කර 27 ක් පමණ වූ 66භූමි භාගයක පිහිටා ඇති වැවේකැලේ පාරිසරික සංචාරක ස්ථානයේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු.4,503,193 ක් ඇස්තමේන්තු සකස් කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි. | අප්‍රමාදව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2019 වර්ෂය සඳහා වෙන් කරන ලද පළාත් සංවර්ධන ප්‍රදාන ව්‍යාපෘති යටතේ සීතාවක වැවේ කැලේ පාරිසරික සංචාරක ස්ථානයේ සංචාරකයින් සඳහා යටිතල පහසුකම් දියුණු කිරිම නමින් රු.2,000,000 මුදලක් සභාව වෙත අනුමතව ඇත. මේ සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ගැනිමට වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු තෝරා ගැනීම සඳහා අවශ්‍ය ලංසු කැඳවීම සිදු කර ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී. 2019 වර්ෂය තුල ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය අනුව 2018 වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීමක් සිදුකර නොතිබුණි. | 2030 න්‍යාය පත්‍රයට අනුව ක්‍රියාත්මක විය යුතුවේ. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව 2018 වර්ෂයේ දී හා 2019 වර්ෂයේදී පළාත් පාලන ආයතන නිලධාරින් සඳහා පුහුණු වැඩමුළු පැවැත්වූ බැවින් 2018 වර්ෂයට අදාලව සැලසුම් සකස් කිරිමට නොහැකි වූ අතර 2019 සිට 2023 දක්වා සැලැස්ම සකස් කර ඇත. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| සභාවේ මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ ද, ද්විතියික ගණයේ නිලධාරීන් පස්දෙනෙකුගේද, ප්‍රාථමික නිලධාරීන් 11 දෙනෙකුගේ පැවති පුරප්පාඩු මෙතෙක් පුරවාගෙන නොතිබුණි. | අප්‍රමාදව සේවක පුරප්පාඩු සම්පූර්ණ කරගත යුතුවේ. | මාණ්ඩලික තනතුරු හා ද්විතිය ගණයේ තනතුරුවල පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙනලෙස ඉල්ලා පළාත් පාලන කොමසාරිස් (බ.ප.) වෙත දන්වා යවා ඇත. ප්‍රාථමික තනතුරු පුරප්පාඩු 1 ක් පවතින අතර ඉන් පුරප්පාඩු 10 ක පුරප්පාඩු පිරවීම සඳහා අනුමතව ඇති අතර එම පුරප්පාඩු ගැසට් පත්‍රයේ පළ කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. තවද වැඩ ක්ෂේත්‍ර කම්කරු තනතුරක පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමට අනුමැතියට ඉදිරිපත් කර ඇත. |
| (ආ) සේවක ණය | | |
| වසර 10 කට වැඩි රු.141,347 ක්වූ සේවක ණය ශේෂය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | හිඟ සේවක ණය ශේෂයන් අදාල ණයකරුවන්ගෙන් හා ඇපකරුවන් ගෙන් අප්‍රමාදව අයකරගත යුතුවේ. | වසර 20 ක පමණ පෙර සිට රු.141,341 ක ණය ශේෂයක් අයකර ගත නොහැකි සේවක ණය ලෙස පවතී. මෙම ණයකරුවන් සේවය හැර යාම, මිය යාම, සේවයෙන් ඉවත් කිරිම හා ස්ථාන මාරු වීම යන කරුණු හේතුවෙන් ණය අය කරගත නොහැකි වී ඇති බව පැරණි ලේඛන පරීක්ෂා කිරිමේදී තහවුරු වේ.<br>එම ලේඛනවල පවතින ලිපිනයන් වලට ණය අය කර ගැනීම සඳහා ලිපි යොමු කළ ද එම ලිපි වැඩි ප්‍රමාණයක් නැවත ආපසු ලැබී ඇත. |

3.3 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
| --- | --- | --- |
| (අ) නිල නිවාස | | |
| (i) ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයේ 6.1 වගන්තියට අනුව 4,3 හා 2 ශ්‍රේණි වලට අයත් නිවාසවල සාමාන්‍ය බදු කාලය වර්ෂ 05 ක් වුවද සභාව සතු නිල නිවාස 07හි පදිංචි සේවකයන් අවුරුදු 24 කට වැඩි කාලයක් අඛණ්ඩව ඒවායේ පදිංචිව සිටි. | ආයතන සංග්‍රහයේ xix වන පරිච්ඡේදයට අනුව කටයුතු කළ යුතුවේ. | සභාව සතු නිල නිවාසවල පදිංචිව සිටි සේවකයින්ගේ ගිවිසුම් කාලය 2018/04/30 දිනෙන් අවසන් විය. නමුත් ඔවුන් නිල නිවාස වලින් ඉවත් නොවූ අතර මේ පිළිබඳව 2018/06/06 දින මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවට යොමු කර මාස 06 ක කාලයක් සඳහා ගිවිසුම්ගත වන ලෙස දැන්වූවද ඔවුන් ගිවිසුමට එළඹුනේ නැත. |
| (ii) නිල නිවාසවල සිටින නිලධාරීන්/සේවකයන් නිවාස සංකීර්ණය තුල අනවසර ඉදිකිරීම් කර ඇති අතර ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යන බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය වුවද සභාව විසින් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි. | | නිල නිවාස වල සිදු කර ඇති අනවසර ඉදි කිරීම් වහාම කඩා ඉවත් කරන ලෙසත් නිල නිවාස පරිශ්‍රයන්හි පවත්වාගෙන යන ව්‍යාපාර වහාම නවත්වන ලෙසත් ඔවුන්ට දැනුම් දී ඇත. |
| (iii) ගිවිසුම් කාලය අහෝසි වීම මත 2018 ජුලි මස සිට 2019 ජනවාරි වනතෙක් මාසික කුලිය අයකර නොතිබූ අතර ඒ අනුව සභාවට රු.137,382 ක පාඩුවක් සිදුවී තිබුණි. | | ගිවිසුම්ගත වූවන්ගේ 2018 ජුලි මස සිට 2019 ජනවාරි මාසය දක්වා වූ හිඟ කුලිය ඔවුන්ගේ ඉල්ලීම පරිදි වාරික වශයෙන් අය කර ගනිමින් සිටි. |
| (iv) ගිවිසුම් කාලය අවසන් වූ නිලධාරීන්/සේවකයන්ගේ නිල නිවාස සන්තකය ආපසු සභාව වෙත පවරා ගැනීමට බලධාරීන් කටයුතු කර නොතිබුණි. | | පිළිතුරු ඉදිරිපත්කර නොමැත. |
| (ආ) අනවසර ඉදිකිරීම් | | |
| සභාවේ අනුමැතියකින් හා ගිවිසුම් වලට එළඹීමෙන් තොරව අවිස්සාවෙල්ල නගරයේ පොදු වෙළඳපල සංකීර්ණයේ අනවසර ලෙස ඉදිකර තිබූ කඩ කාමර 24ක් පැවතුණි. | අප්‍රමාදව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | (i) සභාවේ අනුමැතියකින් තොරව ඉදිකර ඇති අනවසර ඉදිකිරීම් හඳුනා ගනිමින් ඒවා ඉවත් කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවති. |
| (ii) වර්ෂ ගණනාවකට පෙර සභාව විසින් ඉදිකළ සුපිරි වෙළඳ සංකීර්ණයේ සැලැස්මට අනුව කොන්ක්‍රීට් ස්ලැබ් එක මත කඩ කාමර ඉදිකර ආදායම් ඉපයීමට සැලසුම් කර තිබූ නමුත් එම ක්‍රියාවලිය සාර්ථකව සිදුවී නොතිබූ අතර ඉදිකර ඇති කොන්ක්‍රීට් ස්ලැබ් එක යල්පනිමින් පැවති බව භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | (ii) නාගරික සංවර්ධන අධිකාරිය මගින් අවිස්සාවෙල්ල බස් නැවතුම්පල භූමියේ වාණිජ සංකිර්ණය සහ අවට සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියට සමගාමීව වෙළඳ සංකීර්ණයේ කොන්ක්‍රීට් ස්ලැබ් තට්ටුව මත නව සැලැස්මට යෝග්‍ය වන පරිදි කඩ කාමර වල සංශෝධන සැලැස්මක් සකස් කිරිමට පැරණි සැලැස්ම නාගරික |

| | | |
|---|---|---|
| | | සංවර්ධන අධිකාරිය වෙත යොමු කර ඇත. නව සැලසුම් ලබා ගැනීමෙන් පසුව ඉදිකිරීම් කිරිමට යෝජිතයි. |

3.4 වත්කම් කළමනාකරණය
-------------------------------

3.4.1 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්
-----------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) පුවක්පිටිය කඩ සංකීර්ණය<br>---------------------------------- | | |
| පුවක්පිටිය නගරයේ පොදු වෙළඳපල ගොඩනැගිල්ලේ උඩු මහලේ රු.5,949,957ක වියදමක් දරා 2015 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භකර 2017 වර්ෂයේදී නිමකරන ලද කඩ කාමර 12ක් නිශ්ක්‍රියව වසා දමා තිබුණි. | අප්‍රමාදව සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. | කඩ සඳහා තක්සේරුව ලබා ගැනිම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපියක් යොමු කළද ඒ සඳහා පිළිතුරු ලැබී නොමැත. අවස්ථා කීපයකදී දුරකථනයෙන් හා තක්සේරු දෙපාර්තමේන්තුවට ගොස් අදාළ තක්සේරුව කඩිනමින් අවසන් කර දෙන ලෙස ඉල්ලා ඇත. |
| (ආ) සීතාගම ළදරු පාසල<br>-------------------------- | | |
| සීතාගම ළදරු පාසල ඉදිරිපිට ඇති පොදු පහසුකම් ඉඩම ප්‍රජාවගේ සුභ සාධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි. | සුභ සාධන කටයුතු සඳහා යෙදවිය යුතුවේ. | මෙහි ළමා/වැඩිහිටි දෛනික ශරීර සුවතා ව්‍යායාම කිරිමට අවශ්‍ය ක්‍රිඩා උපකරණ මෙන්ම ඇවිදිමේ මන්තීරු ආදිය යෙදීමට අදහස් කර ඇති අතර ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් අඩක් නිමකර නවීකරණ කටයුතු නවතා ඇත. |
| (ඇ) කොටබොඩවත්ත ප්‍රජාශාලාව ඉදිකිරීම.<br>---------------------------------------------- | | |
| 2016 වර්ෂයේ රු.1,769,175 ක වියදම් දරා ඉදිකර තිබූ ප්‍රජාශාලා ගොඩනැගිල්ලෙන් අපේක්ෂිත ප්‍රයෝජන ලබාගෙන නොතිබූ අතර ගොඩනැගිලි භූමිය වල්බිහිවී ජරාවාසව පැවතුණි. | කඩිනමින් සුදුසු පියවරක් ගත යුතුවේ. | ජනතාවට එහි භාරකාරිත්වය ලබා දී වාර්ෂික වැඩ සටහන් මාලාවක් මෙන්ම ශ්‍රමදාන ආදිය සිදු කරමින් පවත්වා ගෙන යාමට තිරණය කොට ඇත. |

3.4.2 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම.
------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| සීතාවකපුර නගර සභා ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියේ ඇති පෙර පාසල පිටුපස ඇති අඩි 15 ක පමණ උස අවදානම් සහිත, ප්‍රතිසංස්කරණය කළ යුතු බැම්මක් වූ අතර එම බැම්ම පෙර පාසැල් දරුවන්ගේ ආරක්ෂාවට දැඩි තර්ජනයක් වී තිබුණි. | අප්‍රමාදව ආරක්ෂිත පියවර ගත යුතුවේ. | පෙර පාසල පසු පස අඩි 15ක පමණ පස් කණ්ඩියක් පවතින අතර එහි ආරක්ෂාව සඳහා පැති බැම්මක් ඉදිකිරිමට ප්‍රතිපාදන ලබා ගැනිමට 2018 වර්ෂයේ දී පළාත් සභා අමාත්‍යංශය වෙතින් ලිඛිතව ඉල්ලිම් කර ඇත. ඉදිරියේ දී ප්‍රතිපාදන ලබා ගැනිමට අපේක්ෂිතයි. |

### 3.4.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| නගර සභාවට අයත් වාහන 08ක් සභාවේ රථගාලේ නිශ්කාර්යව දිරාපත් වෙමින් පැවතුණු අතර එම වාහන සම්බන්ධව සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අප්‍රමාදව කටයුතු කල යුතුවේ. | වාහන 03 ක් හා යන්ත්‍රෝපකරණ මේ වන විට අපහරණය සඳහා තෝරා ගෙන ඇති අතර ඒ සඳහා අවිස්සාවේල්ල ඩිපෝවේ යාන්ත්‍රික ඉංජිනේරු වෙතින් තාක්ෂණික වාර්තාද ලබා ගෙන ඇත. පළාත් මුල්‍ය චක්‍ර ලේඛ 09/2015 ප්‍රකාරව අපහරණ කමිටුව පත්කර ඉදිරි වැඩ කටයුතු කරගෙන යන බව දන්වමි. |

## 4. යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම. |
|---|---|---|
| (අ) වැය විෂයයන් 51 ක් සඳහා සලසා තිබූ එකතුව රු.5,043,500 ක්වූ ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි වී තිබුණු අතර වැය විෂයයන් 20 වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබූ රු.1,952,395 කින් සියයට 50 කට වඩා අඩුවෙන් වැයකර තිබුණි. | අයවැය ලේඛනය ඵලදායී පාලන උපකරණයක් ලෙස භාවිතා කළ යුතුවේ. | වැය විෂයෙන් සඳහා ප්‍රතිපාදන වෙන් කළ ද එම කාර්යයන් සිදු කිරිම අනවශ්‍ය වූ බැවින් හා බලාපොරොත්තු වූ ප්‍රමාණයෙන් වැය නොවූ නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. |